# සංවිධානය වීමේ නිදහස

## අභියෝගයට ලක් වීම



RIGHT TO LIFE HUMAN RIGHTS CENTER

# සංවිධානය වීමේ නිදහස අභියෝගයට ලක් වීම

ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ හා රාජ්‍ය නොවන සංවිධාන වෙත

එල්ල වී ඇති අභියෝග පිළිබඳව අධ්‍යයන වාර්තාව සහ

පනත් සංශෝධන සඳහා යෝජනා

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

2023 මැයි

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

2023 මැයි

දායකත්වය

රචනය : පිලිප් දිසානායක

සංස්කරණය : අජිත් පැරකුම් ජයසිංහ

ප්‍රකාශනය : රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

මුද්‍රණය : ඩිසයින් සිස්ටම්ස් (පුද්) සමාගම

පර්යේෂණ සහාය : දිනිති සුපේක්ෂලා

ව්‍යාපෘති කළමනාකරණය : රශ්මිකා විජේසිංහ

# පටුන


පෙරවදන ..... 4

1 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ඉතිහාසය ..... 7

2 රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීමේ උත්සාහයන් පිළිබඳව ඉතිහාසය ..... 9

3 සිවිල් සමාජ සංවිධාන නියාමනය කිරීම සඳහා වූ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වය ..... 10

4 ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ..... 13

5 සිවිල් සංවිධාන මූලධර්ම ..... 14

6 සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වයේ දින සටහන් ..... 15

7 ප්‍රාදේශීය සංවිධාන මුහුණ දෙන ගැටලු හා විසඳුම් යෝජනා ..... 16

8 ප්‍රාදේශීය සාකච්ඡා ..... 18

9 නිර්දේශ ..... 20

ආශ්‍රිත ලේඛන ..... 21

# පෙරවදන

ශ්‍රී ලංකාවේ සිවිල් සංවිධාන කොපමණ ප්‍රමාණයක් තිබේ ද යන්න පිළිබඳව නිළ ලේඛනයක් සොයා ගැනීමට නොහැක. මෙම සංවිධානවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ පමණක් සංවිධාන 44,000 කට වැඩි ප්‍රමාණයක් ලියාපදිංචි වී ඇති බව වාර්තා වේ. මීට අමතරව සමාගම් පනත, සමිති ආඥා පනත, වෘත්තීය සමිති අඥා පනත, සමූපකාර සමිති ආඥා පනත, විශේෂ පාර්ලිමේන්තු පනත් මගින්, භාරයන් හෝ පදනම් ලෙස ලියාපදිංචි වී ඇති සංවිධාන පිළිබඳව නිවැරදි සංඛ්‍යාවක් සොයා ගැනීමට මෙතෙක් නොහැකි විය.

රජයේ කිසියම් හෝ ව්‍යුහයක ලියාපදිංචි සංවිධානයන්ට වඩා කිසියම් හෝ ව්‍යුහයක ලියාපදිංචි නොවූ සංවිධාන ප්‍රමාණය ඉතා ඉහළ අගයක පවතී. ඒ කෙසේ වුවත්, මෙම සංවිධාන විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් විවිධ වන අතර ඒ බොහෝ සංවිධාන විසින් සිදු කරනු ලබන සේවාවන් ද ඉතා විශිෂ්ට මට්ටමක පවතී. එමෙන්, මේ බොහෝ සංවිධානයන්ට සැලකිය යුතු ජන සහභාගීත්වයක් මෙන්ම, ජන ප්‍රසාදයක් ලැබී තිබීම මෙම සංවිධාන මෙතෙක් පැවතීමට විශාල රුකුලක් ව තිබේ.

ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක මෙම සංවිධාන විදේශ ආධාර ලබන හා විදේශ ආධාර නොලබන සංවිධාන ලෙස ප්‍රධාන කුලක දෙකකට බෙදිය හැක. අද රාජ්‍ය නොවන සංවිධාන (NGO) ලෙස සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ මෙම විදේශීය ආධාර ලබන සංවිධාන කොට්ඨාසයයි.

බොහෝ විට මෙම විදේශීය ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධානයන්හි විෂය පථයට අයත් වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු අනෙකුත් ජාත්‍යන්තර සංවිධානයන්හි මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවේ විශේෂ අවධානයට ලක් වූ මාතෘකාය. නැතිනම්, ඒ පිළිබඳව ජාත්‍යන්තර ප්‍රඥප්තීන් හෝ සම්මුතීන් ගොඩනැගී, සමහර විට ශ්‍රී ලංකා රජය ද එම ප්‍රඥප්තීන් හා සම්මුතීන් අපරානුමත කර, එහෙත් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු නොකරන හෝ අත්හැර දමා තිබෙන ක්ෂේත්‍රයන් කෙරෙහිය.

විශේෂයෙන් නීති විරෝධී ඝාතන, අතුරුදහන් කරවීම්, වධහිංසාවන්, බොරු නඩු පැවරීම්, ඇතුළු මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධව ද, සුළු ජන ප්‍රජාවන්ගේ අයිතිවාසිකම්, ධීවර, ගොවි, වතුකම්කරු ආදී විවිධ ක්ෂෙත්‍රයන්හි නියැලි ජන කණ්ඩායම් මුහුණ දෙන ගැටලු, පාරිසරික අයිතිවාසිකම් ඇතුළු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහ සමාජ, ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් වෙනුවෙන් මෙම රාජ්‍ය නොවන සංවිධාන සක්‍රිය ලෙස ක්‍රියාත්මක වේ.

රජයන් විසින් අත්හරිනු ලබන හෝ වැඩි අවධානයක් යොමු නොකර සඟවාගෙන සිටින ඉහත සඳහන් ක්ෂේත්‍රයන් සම්බන්ධව රාජ්‍ය නොවන සංවිධාන විශාල වශයෙන් කටයුතු කිරීම හේතුවෙන්, සමහර කරනු හෙළිදරව් වීමත්, ඒ හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ආණ්ඩුව වෙත එල්ලවන විවිධාකාරයේ බලපෑමුත් නිසා ඉහත ක්‍රියාකාරීත්වයේ යෙදෙන එම සංවිධාන හා පවතින ආණ්ඩු සමඟ යම් කිසි ව්‍යාකූලත්වයක් හෝ ඝට්ටනයක් නිර්මාණය වීම අනිවාර්යෙන් සිදු වේ.

මේ හේතුවෙන් මෙම සංවිධාන දුර්මුඛ කිරීම හෝ යම් කිසි පාලනයකට ගෙන ඒමට ගත් විවිධ උත්සාහයන් පිළිබඳව විශාල අත්දැකීම් ප්‍රමාණයක් අපට තිබේ. විශේෂයෙන් මේ ක්ෂේත්‍රයන්හි කටයුතු කරනු ලබන සංවිධානයන්ට එරෙහිව දුර්මත සමාජ ගත කිරීම, රාජ්‍ය ආරක්ෂක අංශ මගින් විවිධ බලපෑම් සිදු කිරීම, රාජ්‍ය ව්‍යුහයන් තුළ ලියාපදිංචියට යොමු කිරීමේදී හා ලියාපදිංචියෙන් පසුව විවිධාකාරයේ පරිපාලන ක්‍රියා මාර්ග හරහා බලපෑම් කිරීම වැනි ක්‍රියා පසුගිය කාලය තුළ ඉතා සුලභව දක්නට ලැබුණි.

මේ හේතුවෙන් පසුගියදා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළත්, ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත යටතේත් ලියාපදිංචි වී ඇති සංවිධාන බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ පෑහ. එම සංවිධානයන්හි ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික අනුමැතිය ලබා ගැනීමට සිදු වීම, අලුතින් ලියාපදිංචි කිරීම ඉතා දුෂ්කර වීම, බැංකු ගිණුම් අධීක්ෂණය හා ගිණුම් කටයුතු සීමා කිරීම, තම ප්‍රදේශයෙන් පිට වැඩ කිරීමට විශේෂ අනුමැතිය ලබා ගැනීමට සිදු වීම වැනි කාරණා එසේ ඔවුන් මුහුණ දුන් ප්‍රධාන ගැටලු ලෙස හැඳින්විය හැක. ඊට අමතරව ආරක්ෂක අංශ විසින් නිතර සිදු කරනු ලබන සෝදිසි කිරීම්, නිරන්තර විමසීම් හා ඔවුන්ගේ බියගැන්වෙන සුළු හැසිරීම් හේතුවෙන් බොහෝ ප්‍රාදේශීය සංවිධාන විවිධාකාරයේ පීඩාවන්ට ලක්ව සිටියහ.

මේ සියලු දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටි රාජ්‍ය නොවන සංවිධාන වර්තමානයේ තවත් ගැටලුවකට මුහුණ දී සිටී. ඒ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත සංශෝධනය කිරීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය හිමි වී එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබීම හේතුවෙනි.

ඉහත පසුබිම තුළ නව සංශෝධනය කිසිසේත්ම සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වයට හිතකර එකක් නොවීමට බොහෝ ඉඩ ඇත. නව සංශෝධනය තුළින් සියලුම සංවිධාන එක නීතියක් යටතේ ලියාපදිංචි කිරීමටත්, ඒ හරහා රජයේ නිරන්තර අධීක්ෂණයට හා නිරන්තර සෝදිසි කිරීම් සඳහා භාජනය වීමටත් බොහෝ විට ඉඩ තිබේ. එමෙන්ම, මෙම නව නීතිය යටතේ සමහර සංවිධානයන් හි ක්‍රියාකාරීත්වයන් පාලනය කිරීමටත් උත්සාහ දරනු ඇත.

මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා සියලු රාජ්‍ය නොවන සංවිධාන මේ පිළිබඳව දැනුවත් භාවයකින් හා එක්සත්ව එක අරමුණක් ඔස්සේ ක්‍රියා කළ යුතුව ඇත. නව නීති ගෙන එනු ලබන්නේ නම් ඒ සඳහා සිවිල් සංවිධාන නියෝජිතයින්ගේ ද අදහස් ලබා ගැනීමත්, සංවිධානය වීමේ නිදහස, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර ඇති මූලික අයිතිවාසිකම් හා ජාත්‍යන්තර සම්මුතීන් මගින් ආරක්ෂා කර ඇති අපගේ අනෙකුත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් නව නීති සැකසිය යුතු බවට අප නිරන්තරයෙන් බලපෑම් කළ යුතුය.

මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා ලංකාවේ සක්‍රියව ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධ කරමින් සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ජාතික එකමුතුව ගොඩ නැගීම එක්තරා ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක. 2023 ජනවාරි 12 දා සංවිධාන 400ක නියෝජිතයින් සහභාගී වූ මෙම එකමුතුවේ ජාතික සමුළුවේදී සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන මුහුණ දී ඇති ගැටලු පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කරමින් ඉදිරි සැලසුම් හා ප්‍රතිපත්ති මූලධර්මයන් පිළිබඳව මූලික එකඟත්වයකට පැමිණීමට හැකි විය. ඒමෙන්ම, දිස්ත්‍රික්ක 25 නියෝජනය වන අයුරින් ජාතික විධායක සභාව ස්ථාපිත කර ගැනීමට ද හැකි විය.

ඉහත සමුළුවේදී පැමිණි එකඟත්වයන් අනුව අපගේ ප්‍රතිපත්ති හා මූලධර්ම ඇතුළත් ප්‍රකාශනය හා නව පනත සංශෝධනය කරන්නේ නම් ඒ පිළිබඳව අපගේ යෝජනා ඇතුළත් ප්‍රකාශනයන් දෙකක් 2023 ජනවාරි 31 දින විෂයභාර ඇමති ටිරාන් අලස් මහතා වෙත භාර දීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයා වෙත නිල වශයෙන් භාරදෙනු ලැබීය.

එම යෝජනා ද සැලකිල්ලට ගනිමින් සකස් කළ කෙටුම්පත මේ වනවිට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව වාර්තා වේ. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යවරයාටත්, අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයටත්, ඉන් පසු නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් පසුව මෙම නව පනත පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කිරීමට නියමිත බව වාර්තා වේ.

අපගේ ප්‍රතිපත්ති හා මූලධර්මයන්ට පටහැනිව මෙම පනත ඉදිරිපත් වුවහොත්, ඒ සම්බන්ධව අපගේ විරෝධය පළ කරමින් නෛතික ක්‍රියාමාර්ගයන්ට යොමු වීමත්, පාර්ලිමේන්තුව තුළ මෙය පරාජයට පත්කර ගැනීමත් සඳහා අවශ්‍ය පියවර ගැනීමට අප කටයුතු කළ යුතුය. එම පියවර සාර්ථක නොවන්නේ නම් මෙයට එරෙහිව ජාතික ක්‍රියාකාරීත්වයක් නිර්මාණය කළ යුතුය.

මෙම වාර්තාව සැකසීමේදී හා මෙම වාර්තාවට අවශ්‍ය රැස්වීම් සංවිධානය කිරීමේදී මා නියෝජනය කරනු ලබන රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානයේ දිනිති සුපේක්ෂලා, රශ්මිකා විජේසිංහ ඇතුළු මගේ කාර්ය මණ්ඩලයටත්, ලංකාව පුරා විසිරී සිටින සිවිල් සංවිධාන කැඳවමින් මෙම සාකච්ඡාව පෝෂණය කිරීමට දායක වූ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්ටත් ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

පිලිප් දිසානායක
විධායක අධ්‍යක්ෂ
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

15.06.2023

# 1 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ඉතිහාසය

ලෝක සිවිල් සමාජ ව්‍යාපාරයට මෙන්ම, ලංකාවේ සිවිල් සමාජ ව්‍යාපාරයට ද ඉතා විශාල ඉතිහාසයක් තිබේ. මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතාට අනුව 1912-1915 කාලයේ පැවති අමද්‍යප ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ඇරඹි පැරණිතම සිවිල් සමාජ ව්‍යාපාරය ලෙස සඳහන් කර තිබේ. ඉන් පසුව 1971 කැරැල්ලෙන් පසුව ඇති වූ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය (CRM), සර්වෝදය ව්‍යාපාරය, ජාතීන් අතර යුක්තිය හා සාමය ඇති කිරීමේ ව්‍යාපාරය (MIRJE), ඉන් පසුව, ප්‍රජාතන්ත්‍රීය අයිතින් සුරකීමේ සංවිධානය (MDDR), ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (MOLNAR), අතුරුදහන්වුවන්ගේ මාපිය දූ දරු සංවිධානය (AFMAD), නිදහසේ වේදිකාව (PFF), සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය (NMSJ) ආදිය එසේ බිහි වූ සිවිල් සමාජ ව්‍යාපාරයන් ලෙස සඳහන් කළ හැක.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වෙනුවෙන් හා සමාජ ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් වෙනුවෙන් ද, ගොවි ධීවර ඇතුළු පාරිසරික අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාත්මක සංවිධාන මෙන්ම, ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශයන් මූලික කරගෙන පවතින විවිධ ජීවන අවශ්‍යතා මුල්කරගෙන ගොඩනැගී ඇති මරණාධාර, ග්‍රාම සංවර්ධන, කාන්තා, තරුණ, ණය සමිති හා මිතුරු හවුල් ආදීය සමග ගත් විට සැලකිය යුතු මට්ටමක සිවිල් සංවිධාන ප්‍රමාණයක් ලංකාව පුරා ක්‍රියාත්මක වේ.

මේ සියල්ල රාජ්‍ය ව්‍යුහයට පිටින් ක්‍රියාත්මක වන සංවිධාන බැවින් මේවා රාජ්‍ය නොවන සංවිධාන ගනයට වැටේ. රජයේ කිසිදු අධිකාරියකට යටත් නොවන, එහි කිසිදු අධීක්ෂණයකට භාජනය නොවන, රජයේ කිසිදු ව්‍යුහයකින් පාලනය නොවන, තමුන් විසින් සකස්කරගත් අරමුණක් වෙනුවෙන් කටයුතු කරන මෙවැනි සක්‍රිය පුරවැසි ක්‍රියාකාරීත්වයක් සහිත රාජ්‍ය නොවන සංවිධාන 44,000ට වැඩි ප්‍රමාණයක් මේ වන විට රජයේ ලියාපදිංචි වී ඇති බව ද වාර්තා වේ. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ලේකම් කාර්යාලයේ සංවිධාන 1730ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යල තුළ සංවිධාන 982ක් හා ප්‍රදේශීය ලේකම් කාර්යාල තුළ සංවිධාන 41,000 වැඩි ප්‍රමාණයක් 2023 ජනවාරි මාසය වන විට ලියාපදිංචි වී ඇති බව සඳහන් වේ. එසේ කුමන හෝ රාජ්‍ය ව්‍යුහයක මෙතෙක් ලියාපදිංචි වී නොමැති සංවිධාන ප්‍රමාණය ඊටත් වඩා බොහෝ වැඩි විය හැක.

මෙම සිවිල් සංවිධාන ලංකාවේ ක්‍රියාත්මක නොවන්නට, ජනතාවගේ මූලික අයිතිවාසිකම් ඇතුළු මානව හිමිකම් පිළිබඳවත්, අපරාධ හා සිවිල් නීති සම්බන්ධවත්, කාන්තා හා ළමා අයිතිවාසිකම් හා සුළුතර ප්‍රජාවන්ගේ අයිතීන් පිළිබඳවත්, ගොවි, ධීවර හා පරිසරික අයිතීන් සම්බන්ධයෙනුත්, නිදහස් හා සාධාරණ මැතිවරණයන් පිළිබඳවත් අවබෝධය මෙන්ම ඒ සම්බන්ධව ක්‍රියාකාරීත්වයත් මීටත් වඩා බොහෝ අඩුවීමට වීමට ඉඩ තිබුණි.

මෙම සිවිල් සංවිධාන මිනිසුන් අතර ජනප්‍රිය වුයේ අතීතයේ සිට එහි ක්‍රියාකාරීන් විවිධ අභියෝගයන් මැද්දේ විශාල කැප කිරීමකින් හා උද්‍යෝගයකින් ඒ සම්බන්ධව කටයුතු කළ නිසාය. ලෝකයේ අලුත් දැනුම හා සංස්කෘතීන් මිනිසුන් අතරට රැගෙන ගියේ මෙම සිවිල් ක්‍රියාකාරීත්වය විසිනි. සමහර අවස්ථාවලදී රටේ ඇති වූ දේශපාලනික තත්ත්වයන් නිසා මෙසේ ක්‍රියාත්මක වූ සමහර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදු විය.

1988-89 භීෂණ සමයෙන් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ තොරතුරු ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, ඇම්නෙස්ටි ජාත්‍යන්තරය වැනි සංවිධාන වෙත යොමු කිරීමට කටයුතු කළේ අතුරුදහන් වූවන්ගේ මා පිය දූ දරු වැනි සංවිධාන විසිනි. එම සංවිධානය නියෝජනය කළ සමහර ක්‍රියාකාරීන් එවකට පැවති රජයේ දැඩි

මර්දනයට හසුවිය. මාතර, චන්ද්‍රදාස රණසිංහ වැනි අය අතුරුදහන් වූයේ මාතර ප්‍රදේශයේ අතුරුදහන් වූ පවුල් කිහිපයක තොරතුරු ලබාගෙන එන අතරතුර එම තොරතුරු පත්‍රිකා ද සමගිනි. එසේ ජීවිත පරිත්‍යාගයෙන් ඔවුන් විසින් එකතු කරන ලද තොරතුරු වාර්තා එදා ජිනීවා මානව හිමිකම් කවුන්සිලය වෙත රැගෙන යනු ලැබුවේ මහින්ද රාජපක්ෂ හා වාසුදේව නානායක්කාර වැනි එවකට විපක්ෂය නියෝජනය කළ මන්ත්‍රීවරුන් විසිනි. එම  තොරතුරු ජාත්‍යන්තර තලයේ විශාල වශයෙන් ව්‍යාප්ත වීම නිසා ඇති වූ පීඩනයෙන් මිදීමට එවක පැවති රජයට තම මර්දනය ලිහිල් කිරීමට සිදු විය. ඒ නිසාම සැලකිය යුතු තරුණ තරුණියන් පිරිසක් මරණයෙන් නිදහස් වූ අතර, පසුව පත්වූ ආණ්ඩු තුළ ඒ අයගෙන් සමහරෙක් මැති ඇමතිකම් පවා දැරූහ.

මේ ආකාරයේ ඉතා වැදගත් හා ඉතා අවදානම් සහගත ක්‍රියාමාර්ගයන් පවා මෙම සිවිල් සංවිධාන නියෝජිතයින් විසින් සිදු කර තිබුණි. මුල් අවස්ථාවේ මැතිවරණ නිරීක්ෂණයන්හි යෙදුන සිවිල් කණ්ඩායම් වෙත ද දැඩි මර්දනයන් දියත් විය. සමහර අවස්ථාවල දී සිදු වූ පහරදීම් නිසා ඔවුන්ට ශාරීරික දුබලකම්වලට පවා මුහුණ දෙන්නට සිදු විය. මෙසේ සිදු කළ ක්‍රියාකාරකම් හා කැපකිරීම් නිසා සැලකිය යුතු ජන ප්‍රසාදයක් මෙම සංවිධාන විසින් දිනාගෙන තිබුණි.

නමුත්, මෙම තත්ත්වය පසු කාලීනව දැනුවත්ව හා සැලසුම් සගතව වෙනස් කිරීමට එවකට පැවති දේශප්‍රේමීන් යැයි කියාගත් ආණ්ඩු මෙන්ම, විපක්ෂය නියෝජනය කළ පිරිස් විසින් කටයුතු කරන ලදී. සාමය, සංහිදියාව, මානව හිමිකම්, මාධ්‍ය නිදහස ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී නිදහස වෙනුවෙන් කටයුතු කළ සංවිධානයන්හි කටවල් වසා ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය අඩපණ කර, සමාජයෙන් කොන්කර ඔවුන් ජන අප්‍රසාදයට පත්කර තැබීමට ඔවුන්ට අවශ්‍ය වී තිබුණි.

එම  අරමුණෙන් එවැනි සංවිධාන ඉලක්ක කරමින් විශාල අවලාද හා ද්වේෂ සහගත ප්‍රචාරයන් එවකට පැවති රජයන් ද, ඊට සහාය දැක්වූ විපක්ෂයේ පිරිස් විසින් ද කරගෙන යන ලදී. ඊට නොමඳ සහායක් රජයේ හා  සමහර පෞද්ගලික නාලිකා මගින් ලබා දෙන ලදී. ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ඉතා දූෂිත බව ද, සමහරු අන්තවාදී කණ්ඩායම් සමග සම්බන්ධතා ඇති බව ද ඔවුන් විසින් ප්‍රචාරය කරන ලදී. මේ විවේචනයන්ට දශකයකට වැඩි කාලයක් ගතව ඇතත්, මේ සම්බන්ධව කිසිවෙකුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීමක් හෝ අවම වශයෙන් මේ සම්බන්ධව කිසිදු පරීක්ෂණයක් හෝ ආරම්භ කර ඇති බවක් අපට මෙතෙක් වාර්තා නොවේ.

# 2 රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීමේ උත්සාහයන් පිළිබඳව ඉතිහාසය

රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීම සඳහා බොහෝ ආණ්ඩු විවිධ උත්සාහයන් ගෙන තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් ආරක්ෂා කිරීමට ක්‍රියා කරන මුවාවෙන් රට පිළිබඳව වැරදි තොරතුරු එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු අනෙකුත් සංවිධාන වෙත වාර්තා කිරීම, විදේශ අරමුදල් ලබාගෙන ඒවා අවභාවිතා කිරීම, සමහර සංවිධාන ආණ්ඩු අස්ථාවර කිරීමට හෝ ආණ්ඩු පෙරළීමට උත්සාහ කිරීම රාජ්‍ය නොවන සංවිධාන වෙත ඉදිරිපත් වී ඇති ප්‍රබල චෝදනාය.

ශ්‍රී ලංකාවේ ඇති වූ සිවිල් යුදමය තත්ත්වයත්, පාස්කු ප්‍රහාරයත් සමග සිවිල් සංවිධාන වෙත තවත් චෝදනා පත්‍රයක් එකතු විය. සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වීම, ඒකීය රාජ්‍ය ස්වෛරීභාවය, ස්වාධීනත්වය සහ භෞමික අඛණ්ඩත්වයට තර්ජනයක් වීම, වාර්ගික හා ආගමික සහජීවනයට බලපෑම් සිදු කිරීම එම ප්‍රධාන චෝදනා ලෙස හැඳින්විය හැක.

මීට අමතරව, සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය තුළ විශාල දූෂණ, වංචා හා අක්‍රමිකා පවතින බවත්, මෙම සංවිධාන ක්‍රියාකාරීත්වයන් තුළ විනිවිදභාවයක් හෝ වගවීමක් නොමැති බවත් රජය ඉදිරිපත් කරනු ලබන අනෙකුත් චෝදනාය.

සිවිල් සංවිධාන වෙත ඉදිරිපත් වී ඇති මෙම චෝදනා ඉතා බරපතල වන අතර, කිසියම් සංවිධානයකට එරෙහිව එවැනි චෝදනාවක් පවතින්නේ නම් එය ඉතා බැරෑරුම් චෝදනාවක් ලෙස අප ද සලකනු ලබයි. ඒ සඳහා දැනට පවතින නීති යටතේ පියවර ගැනීම අනිවාර්යෙන් සිදු කළ යුතුය.  නමුත් ඒ සඳහා නව නීති පැණවීමේ කිසිදු අවශ්‍යතාවයක් අපට නොපෙනේ.

වංචා, දූෂණ හෝ අක්‍රමිකතා සම්බන්ධව අපගේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ කටයුතු කළ හැකි අතර, ත්‍රස්තවාදී කටයුතු සඳහා උදව් කිරීම සම්බන්ධව 2005 අංක 25 දරන ත්‍රස්තවාදී මුල්‍යකරණ මර්දනය කිරීමේ පනත යටතතේත්, 2006 අංක 6 දරන මුල්‍ය ගනුදෙනු වාර්තාකරන පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධකරණය වැළැක්වීමේ පනත වැනි පනත් යටතේත් කටයුතු කළ හැක. මේ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, මුල්‍ය අපරාධ විමර්ශන අංශය, ත්‍රස්තවාදී විමර්ශන අංශය හා මහ බැංකුවේ මුල්‍ය බුද්ධි ඒකකය වැනි විශේෂ රාජ්‍ය බුද්ධි නියෝජිත ආයතන හරහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට හැකියාව තිබේ.

එමෙන්ම, වෙනත් සිවිල් හෝ පරිපාලන ගැටලුවක් වේ නම් හෝ යම් කිසි පුද්ගලයෙකුට සිදුවන පාඩුවක්, වන්දියක් හෝ සහන ලබා ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සිවිල් නීතිය තුළ අවශ්‍ය තරම් පිළියම් තිබේ. එබැවින් සිවිල් සංවිධාන සඳහා නැවත අලුතින් නීති සම්පාදනය කිරීම කිසිසේත් සාධාරණය කළ නොහැක.

එමෙන්ම, නව නීතියක් සැකසෙන්නේ නම්, ඒ සඳහා සිවිල් සමාජ නියෝජිතයින්ගේ අදහස් හා යෝජනා ලබා ගනිමින් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව ප්‍රඥප්තියේ මූලධර්ම මත පදනම්ව එම කටයුත්ත සිදු විය යුතුය.

# 3 සිවිල් සමාජ සංවිධාන නියාමනය කිරීම සඳහා වූ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වය

- **පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව . 2005 (නන්දන ගුණතිලක/ විජිත හේරත් වාර්තාව)**

රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය හා බලපෑම පිළිබඳ කරුණු විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් 2005 අගෝස්තු මස 30 වන දින පත් කරනු ලැබීය. එවකට ජනතා විමුක්ති පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී නන්දන ගුණතිලක මහතාගේ සභාපතිත්වයෙන් පිහිටවූ මෙම කාරක සභාවට තවත් මන්ත්‍රීවරු 22 දෙනෙකු තේරී පත් වූහ. පසුව නන්දන ගුණතිලක පෞද්ගලික හේතුවක් මත කාරක සභාවේ සභාපතිත්වයෙන් ඉවත් වූ අතර ඒ සඳහා එම පක්ෂයේම පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා පත් විය.

මෙම කාරක සභාව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විදේශාධාර ලබන රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව සොයා බැලීම, එම රාජ්‍ය නොවන සංවිධානයන්හි මූල්‍ය කටයුතුවල පවත්නා විනිවිදභාවය කවරාකාරදැයි සොයා බැලීම, එකී රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය හා ජාතික ආරක්ෂාව කෙරෙහි බලපා ඇත්තේ කවර අයුරින්දැයි හඳුනා ගැනීම, එම රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය ජාතික සහ සමාජ යහපැවැත්ම කෙරෙහි බලපා ඇත්තේ කවර අයුරින්දැයි හඳුනාගැනීම, මෙම රාජ්‍ය නොවන සංවිධාන අරභයා ශ්‍රී ලංකා රජය කටයුතු කළ අන්දම පිළිබඳ කරුණු සොයා බලා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස වූ විශේෂ කාරක සභාවක් ලෙස කටයුතු කරනු ලැබීය.

එම වාර්තාවේ යෝජනා අතර,

01. රාජ්‍ය නොවන සංවිධානවල විනිවිදභාවය හා වගවීම වර්ධනය වන ආකාරයට විධිමත් කිරීම හා ක්‍රමවත් නීති පද්ධතියක් හඳුන්වා දීම යෝජනා කරන අතර 1980 අංක 31 දරන සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත අවලංගු කොට නව පනත් කෙටුම්පතක් සකස් කර නීතිගත කළ යුතු බව අවධාරණය කරයි.

02. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අධීක්ෂණය සඳහා වූ නීති ප්‍රතිපාදන සකස් කිරීම සඳහා සියලු බලතල සහිත කොමිෂන් සභාවක් පත් කිරීමට ද රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලංකාවේ විධිමත් නිර්වචනයක් නොමැති හෙයින් සහ පවත්නා පනතේ නිර්වචනය ප්‍රමාණවත් නොවන හෙයින් රාජ්‍ය නොවන සංවිධාන වෙනත් කිසියම් නීතියක් යටතේ ලියාපදිංචි වී තිබුණ ද අනිවාර්යෙන්ම මෙම කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමට යෝජනා කරයි.

03. වාර්තාවේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ නිර්වචනයක්ද සපයනු ලබයි දේශීය හා විදේශීය ආධාර සහිතව සමාජ ආරක්ෂණය, සුබසාධනය හා සංවර්ධනය අරමුණු කර දේශීය නීති හා ප්‍රතිපත්ති රාමුවට ද සාරධර්මවලට ද අනුකූල වූ ව්‍යවස්ථාවක් හා කළමනාකාරණ පද්ධතියක් සහිතව ලාභ අපේක්ෂාවෙන් තොර ස්වේච්ඡාවෙන් සේවය කිරීම සඳහා රාජ්‍ය ගිවිසුමක් නොමැතිව පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් ගොඩනගාගත් සියලුම සංවිධාන ස්වේච්ඡා සමාජ සංවිධාන හෙවත් රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් නිර්වනය කෙරේ.

04. හඳුන්වා දෙනු ලබන කොමිෂන් සභාවේ කාර්ය හා බලතල, රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ ප්‍රතිපත්ති, ඒවා කළමනාකරණය සහ අධීක්ෂණයට අවශ්‍ය ප්‍රතිපත්ති, විගණනයට සහ විමර්ශනයට අදාළ නීතිමය විධිවිධාන ඇතුළත් කළ යුතු වීම.

05. මෙම කොමිෂන් සභාවේ බලතල දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවලට විමධ්‍යගත කර ක්‍රියාත්මක කිරීමට සැලස්වීම. එහිදි රාජ්‍ය නොවන සංවිධානවල දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාකාරකම් රාජ්‍ය යාන්ත්‍රණය සමග ඒකාබද්ධ කරන වැඩපිළිවෙලක් සකස් විය යුතුය.

06. රාජ්‍ය නොවන සංවිධාන සඳහා අනිවාර්ය ලියාපදිංචියක් මෙම කමිටුව නිර්දේශ කර ඇත. 'ලියාපදිංචි නොවූ රාජ්‍ය නොවන සංවිධාන සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැවින් රාජ්‍ය නොවන සංවිධාන මෙරට තුළ ලියාපදිංචි කිරීම අනිවාර්ය කළ යුතු බවද රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේදි එය රටේ පවතින මූලික නීතියට යටත්ව හා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසිවලට යටත්ව සිදුකළ යුතුය.'

- **ජාතික ආරක්ෂාව සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාව . 2020 (මලිත් ජයතිලක වාර්තාව)**

ජාතික ආරක්ෂකව සඳහා වූ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ජාතීන් හා ආගම් අතර මිත්‍රත්වය වර්ධනය කරවමින් නව ත්‍රස්තවාදය හා අන්තවාදය මුලිනුපුටා දැමීමට අවශ්‍ය වන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ නීති රීති සම්පාදනය සහ ක්‍රියාත්මක කරවීමේ යෝජනාවලිය සම්බන්ධයෙන් වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ, 2020 පෙබරවාරි මස 19 දාය. මෙම කාරක සභාවේ සභාපතිත්වය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මලිත් ජයතිලක මහතා විසින් උසුලනු ලැබූ අතර තවත් සභිකයින් 16 දෙනෙකු මෙම කාරක සභාවට පත් විය.

සිවිල් සමාජය සහ එහි ක්‍රියාකාරීත්වය, පාලනය සම්බන්ධයෙන් නිර්දේශ ගණනාවක් ද මෙම වාර්තාවට ඇතුළත්ව තිබුණි. උතුරු නැගෙනහිර යුද සමය තුළ දේශීය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ මහජනතාවට තිබුණා යැයි ඔවුන් විසින් පවසන ලද විරෝධාකල්පය, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් කෙරුණු විමර්ශනවලදී අනාවරණය කෙරුණා යැයි කමිටුව විසින් සඳහන් කරන රාජ්‍ය නොවන සංවිධානවල ලියාපදිංචිය පිළිබඳ ගැටලුව මෙන්ම මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සහ ජාතික බුද්ධි සේවා ප්‍රධානියා හරහා ලබාගත් තොරතුරු අනුව සිවිල් සමාජය, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්ත ක්‍රියා සඳහා මුදල් සැපයීම යන මේවා අතර සම්බන්ධයක් ඇතැයි යන කාරණා මත පදනම්ව නිර්දේශ නිකුත් කිරීමට මෙම කමිටුව කටයුතු කර තිබේ.

සිවිල් සමාජ සංවිධාන දැනට වඩා බරපතළ ලෙස රාජ්‍ය අධීක්ෂණයට ලක්කළ යුතු යැයි කමිටුව විසින් අවධාරණය කරයි. එසේම පැවති රජය විසින් ගෙන එනු ලදුව පසුව අත්හැර දැමූ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය සහ අධීක්ෂණය) පනතෙහි සංශෝධන පනත් කෙටුම්පත ගැසට් කර එය සම්මත කරගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. මහ බැංකුවේ මුදල් බුද්ධි මණ්ඩලය, ජාතික බුද්ධි ප්‍රධානියාගේ කාර්යාලය සහ රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ඒකාබද්ධ වැඩසටහනක් හරහා දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට ලැබෙන මුදල් ආධාර නියාමනය කිරීමට ද වාර්තාව මගින් නිර්දේශ කරනු ලැබ තිබේ. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය යටතේ විදේශ දායකත්ව නියාමන පනත වැනි පනතක් ස්ථාපිත කිරීම සහ ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ආධාර නිසි ලෙස විගණනය කිරීමට පියවර ගැනීම ඇතුළු නිර්දේශ ගණනාවක් මෙමගින් ඉදිරිපත් කර තිබේ.

නිර්දේශ -

1. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පනත් කෙටුම්පතට අදාළ ගැසට් නිවේදනය නිකුත් කිරීමට ඇති සියලු බාධක වහාම ඉවත් කර එය ගැසට් කිරීම

2. රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන්ම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය සමාජ සේවා අමාත්‍යාංශයේ හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කිරීම

3. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය නොමැතිව ක්‍රියාත්මක වන සංවිධාන නීති විරෝධී සංවිධාන ලෙස නම් කිරීම හා එවැනි සංවිධානවලට ලබා දෙන

දඬුවම් නිර්වචනය කිරීමට පියවර ගැනීම. විශේෂයෙන්ම 2003 අංක 7 දරන සමාගම් පනත යටතේ ලාභ නොලබන, ඇපයෙන් සීමිත සමාගම් ලෙස ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන ලෙස කටයුතු කරන සංවිධාන නීතියේ රැහැනට හසු කර ගැනීමට කටයුතු කිරීම.

4. ශ්‍රී ලංකාවට රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ ලැබෙන සියලු විදේශ අරමුදල් හා ආධාර පුළුල් නියාමනයකට ලක් කිරීමට හැකි වන පරිදි අදාළ ලේකම් කාර්යාලය මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය හා ජාතික බුද්ධි ප්‍රධානී එක් කළ යාන්ත්‍රණයක් ගොඩනැගීම

5. රාජ්‍ය නොවන ලේකම් කාර්යාලය යටතේ විදේශ දායකත්ව නියාමන පනත (Foreign Contribution Regulation Act) වැනි පනතක් ස්ථාපනය කොට එමගින් ද ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ආධාර මුදල් නිසි විගණනයකට ලක් කළ යුතුය. එසේම එම මුදල් සමාජයේ සියලු ජන කොටස්වලට පොදු ප්‍රතිලාභ ලැබෙන පරිදි සමාජීය කටයුතු වෙනුවෙන් යෙදෙවන බවට සහතික කිරීම නියාමනය කළ යුතුය.

6. බොහෝ රටවලදී මෙන් රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් ස්වේච්ඡා සංවිධාන එක් ආයතනයක් තුළ පමණක් ලියාපදිංචි කිරීම නැතහොත් රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීම

7. පෞද්ගලික මන්ත්‍රී යෝජනා ලෙස පාර්ලිමේන්තුවට ගෙන එන පනත් මගින් එක් ජන වර්ගයකට හෝ එක් ආගමික කණ්ඩායමකට පමණක් ප්‍රතිලාභ අත්වන පදනම්, භාර, අරමුදල් හා සංවිධාන නීතිගත නොකිරීමට හැකිවන පරිදි පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සුදුසු පරිදි සංශෝධනය කිරීම, තවදුරටත් පාර්ලිමේන්තුවේ සම්මත වන පදනම්, භාර හෝ අරමුදල්වල පාලක මණ්ඩල එක් පවුලකට හෝ ඥාති සම්බන්ධතා ඇති පවුල් කිහිපයකට පමණක් සීමා නොවන බවට තහවුරු කළ යුතුය.

8. යෝජිත රාජ්‍ය නොවන සංවිධාන සංශෝධිත පනත් කෙටුම්පත තුළ දැනට සඳහන් (හදිසි අවස්ථාවන්හිදී රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය) යන වගන්තිය ඉවත් කිරීමට පාර්ලිමේන්තු කමිටු අවස්ථාවේදී කටයුතු කළ යුතුය. මන්ද එම වගන්තිය තුළින් නැවතත් ලියාපදිංචිය පිළිබඳ මූලික නීතියේ හිඩැසක් ඇති වීම අනිවාර්යයෙන්ම සිදු වන බැවිනි.

# 4 ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය

## 2018 පෙබරවාරි 20 කැබිනට් පත්‍රිකාව

ඉහත, නන්දන ගුණතිලක/ විජිත හේරත් පාර්මේන්තු තේරීම් කාරක සභාවේ නිර්දේශයන් පරිදි 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත යහපාලන ආණ්ඩු සමයේ 2018 පෙබරවාරි 20 දින ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගතිය සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ හිටපු අමාත්‍ය මනෝ ගනේෂන් මහතා විසින් සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.

මෙම සංශෝධන සඳහා සිවිල් සමාජයේ අදහස් ලබා ගන්නා ලෙස අමාත්‍යවරයාගෙන් කළ ඉල්ලීම්වලට සුදුසු ප්‍රතිචාර නොලැබීම හේතුවෙන් මේ පිළිබඳව සිවිල් සමාජ නියෝජිතයින් සහභාගී වන සාකච්ඡාවක් 2018 මාර්තු 27 වන දින හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සමග පවත්වන ලදී. එහි දී පැමිණි එකඟතාවයන් මත ඉහත කැබිනට් පත්‍රිකාව අග්‍රාමාත්‍යවරයා විසින් ඉල්ලා අස්කර ගැනීමට එකඟ විය.

එමෙන්ම, අග්‍රාමාත්‍යවරයා සමග පැමිණි එකඟත්වයකින් පසුව සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් විසින් මෙම කෙටුම්පත සඳහා අදාළ සංශෝධනයන් ඉදිරිපත් කරන ලෙස කළ දැනුම්දීමට අනුව, සිවිල් සමාජ නියෝජිතයින් විසින් දිවයින පුරා පළාත් නමයම නියෝජනය කරමින් සිවිල් සංවිධාන නියෝජිතයින් 233ක් සමග සිදු කළ අදහස් විමසීමකින් පසුව 2019 අගෝස්තු මාසයේ දී 1980 අංක 31 දරන පනත සඳහා යෝජිත සංශෝධන විෂය භාර ඇමතිවරයාට හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය වෙත භාරදෙන ලදී.

නමුත්, 2019 නොවැම්බර් මාසයේ සිදු වූ හදිසි ආණ්ඩු මාරුවෙන් පසුව මෙම ක්‍රියාවලිය නැවතත් සම්පූර්ණයෙන් ඇණ හිටි අතර, එතෙක් ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගතිය සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ජාතික ලේකම් කාර්යායල රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත්කර තිබුණි.

ඉන් පසුව රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය සඳහා නව අධ්‍යක්ෂකවරයෙකු පත් වූ අතර, 2020 ජුනි මාසයේ දී පත් වූ නව අධ්‍යක්ෂකවරයා විසින් රාජ්‍ය නොවන සංවිධාන පනත සංශෝධනය සඳහා යෝජනා ලබා දෙන ලෙස කළ ඉල්ලීම අනුව ද 2019 අගෝස්තු මාසයේ දී එම ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ යෝජනා නැවතත් 2020 අගෝස්තු මාසයේ ඔහු වෙත යොමු කරන ලදී.

## 2021 අගෝස්තු 09 කැබිනට් පත්‍රිකාව

නැවතත්, 2021 අගොස්තු 09 වන දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ලෙස හිටපු ජනාධිපති ගොඨාභය රජපක්ෂ මහතා විසින් 1980 අංක 31 දරන පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.

ඉන් පසුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ලේකම් කාර්යාලය විදෙස් කටයුතු අමාත්‍යාංශය වෙතත්, ඉන්පසුව මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතටත් පත් කරන ලදී.

# 5 සිවිල් සංවිධාන මූලධර්ම

සිවිල් සංවිධාන වෙනුවෙන් විශේෂ නව නීතියක් කිසිසේත් අවශ්‍ය නොවන බව අප දිගින් දිගටම පෙන්වා දී තිබේ. නමුත් කුමන හෝ කරුණක් මත රජය විසින් සිවිල් සංවිධාන ඉලක්ක කර නව නීති ගෙන එන්නේ නම් එම නීති පහත මූලධර්මයන් මත පිහිටා සකස් විය යුතු බව අප පෙන්වා දී තිබේ.

1 අදහස් ප්‍රකාශ කිරීමේ, සමාගමේ හා රැස්වීමේ නිදහස යන මූලික අයිතිවාසිකම්වලට ගරු කරමින් අදාළ නීති සම්පාදනය.

2 රාජ්‍ය නොවන සංවිධාන වෙත සමාන ලෙස සැලකීම හා වෙනස් කොට නොසැලකීම.

3 අනවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම් හෝ අත පෙවීම් නතර කොට සංවිධානයේ ස්වාධීනත්වය හා සංවිධානයේ වටිනාකම් ගරුකරමින් නිදහසේ කටයුතු කිරීමට ඉඩ කඩ සලසා දීම.

4 අවශ්‍යතා මත ජාලගතවීම, සන්නිවේදනය, අනෙකුත් සංවිධාන හෝ කණ්ඩායම් සමග ඒකාබද්ධව කටයුතු කිරීමට ඇති අයිතියට ගරු කිරීම.

5 නීත්‍යානුකූලව ලැබෙන අරමුදල් සංවිධානයේ අරමුණු හා සැලසුම් මත වැය කිරීමට නිදහස ලබා දීම.

6 සිවිල් සමාජ සංවිධාන ඉලක්ක කර සකසනු ලබන නීති සඳහා එම සංවිධානයන්හි අදහස් ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසීම සහ නීති සකසන්නේ නම් ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම.

7 සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය සක්‍රියව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පරිසරය රට තුළ නිර්මාණය කිරීම.

**වර්තමානය වන විට රාජ්‍ය නොවන සංවිධාන ආකාර කිහිපයකට ලියාපදිංචිය සිදු කල හැක.**

1 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත

2 සමාගම් පනත

3 භාරයක් ලෙස භාර ඔප්පුවක් මගින්

4 සමිති ආඥා පනත

5 වෘත්තීය සමිති ආඥා පනත

6 සමූපකාර සමිති ආඥා පනත

7 පාර්ලිමේන්තු පනත් මගින් ලියාපදිංචි කරන පුණ්‍ය ආයතන, භාරයන් හෝ පදනම් ලෙස

ඉහත කිසිදු නීතියක් යටතේ ලියාපදිංචි නොවී සංවිධානයකට කටයුතු කිරීමට තිබෙන නිදහස අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ආ) සහ (ඇ) ව්‍යවස්ථාවේ සඳහන් රැස්වීමේ හා සමාගමේ නිදහස මගින් තහවුරු කර තිබේ. ඒ අනුව සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, නිදහසේ වේදිකාව, සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය වැනි සංවිධාන එසේ ලියාපදිංචි නොවී සැලකිය යුතු වැඩකොටසක් සිදු කළ සංවිධාන ලෙස සඳහන් කළ හැක.

# 6 සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වයේ දින සටහන්

1 2018 මාර්තු 27 දින හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ හා සිවිල් සමාජ නියෝජිත හමුවේදී කැබිනට් පත්‍රිකාව ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව, 2018 මැයි සිට 2019 ජුනි දක්වා පනත සංශෝධනය සඳහා අදහස් ලබා ගැනීම පළාත් 9 නියෝජනය වන අයුරින් සිවිල් සංවිධාන නියෝජිතයින් 233 කගේ අදහස් ලබා ගැනීම.

2 2019 අගෝස්තු - ඉහත සඳහන් ප්‍රතිපත්ති හා මූලධර්ම මත සිට 1980 අංක 31 දරන පනත සංශෝධනය සඳහා සිවිල් සමාජ නියෝජිතයින්ගේ යෝජනා ඇතුළත් සංශෝධන විෂය භාර ඇමතිවරයාට හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය වෙත භාර දීම.

3 2020 අගොස්තු - හදිසි ආණ්ඩු මාරුවෙන් පසුව රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකවරයා කළ ඉල්ලීම අනුව සිවිල් සමාජ යෝජනා නැවතත් ඔහු වෙත යොමු කිරීම.

4 2021 සැප් 16 සිට 2022 අගොස්තු 27 - පළාත් 9 නියෝජනය කරමින් සංවිධාන 500කට ආසන්න ප්‍රමාණයක් සමග සිදු කළ සාකච්ඡාවකින් පසුව 2019 අප විසින් ඉදිරිපත් කළ සිවිල් සමාජ යෝජනා තව දුරටත් සංවර්ධනය කිරීම. ප්‍රාදේශීය සංවිධාන ඔවුන් මුහුණ දෙන ගැටලු හා ඊට විසඳුම් යෝජනා ඇතුළත් වාර්තාවක් සැකසීම.

5 2022 සැප්තැම්බර් 23 - මහජන ආරක්ෂාව පිළිබඳව අමාත්‍ය ටිරාන් අලස් මහතා සමග සංශෝධිත පනත පිළිබඳ සිවිල් සමාජ නියෝජිතයින්ගේ සාකච්ඡා ආරම්භ වීම.

6 2022 ඔක්තෝබර් - රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය සඳහා නව අධ්‍යක්ෂකවරයා ලෙස සංජීව විමලගුණරත්න මහතා පත්වීම හා පසුව ඔහු සමග සාකච්ඡා ආරම්භ කිරීම.

7 2022 ඔක්තෝබර් 07 - පසුගිය රජය විසින් සකස්කර තිබූ ස්වේච්ඡා සංවිධාන සම්බන්ධ කෙටුම්පත් ලියවිල්ල සිවිල් සමාජ නියෝජිතයින් වෙත නිල වශයෙන් ලබා දීම. ඇමතිවරයා සමග පැවති දෙවැනි සාකච්ඡාවේ දී එම ලියවිල්ලට අපගේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කිරීම.

8 අමාත්‍යවරයා සමග පැවති තුන් වන සාකච්ඡාවේදී එම කෙටුම්පත ඉල්ලා අස්කරගැනීමට එකඟවීම හා නව පනත සිවිල් සමාජය හා ඒකාබද්ධව සැකසීම සඳහා කැමැත්ත පළ කිරීම.

9 2022 දෙසැම්බර් 27 - සිවිල් සංවිධන මුහුණ දෙන පරිපාලන ගැටලු පිළිබඳව නව අධ්‍යක්ෂක ජනරාල්වරයා සමග සාකච්ඡා කිරීම.

10 2023 ජනවාරි 12 රාජ්‍ය නොවන සංවිධාන 400ක් සහභාගී වූ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිත සමුළුව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ (SLFI) පැවැත්වීම. එහිදී රාජ්‍ය නොවන සංවිධාන ඉදිරි සැලසුම්, ප්‍රතිපත්ති හා මූලධර්ම පිළිබඳවත්, නව පනතක් සම්බන්ධවත් සාකච්ඡා කිරීම.

11 2023 ජනවාරි 31 සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන එකමුතුව විසින් සිවිල් සංවිධාන ප්‍රතිපත්ති හා මූලධර්ම පිළිබඳව හා නව පනතක් සඳහා කෙටුම්පතක් අමාත්‍යවරයා වෙත භාරදීම සඳහා අධ්‍යක්ෂක ජෙනරාල්වරයා වෙත බාරදීම.

# 7 ප්‍රාදේශීය සංවිධාන මුහුණ දෙන ගැටලු හා විසඳුම් යෝජනා

සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ජාතික එකමුතුව විසින් 2021 සැප්. 16 සිට 2023 මැයි දක්වා කාලය තුළ කොළඹ හා ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය නොවන සංවිධාන 500කට ආසන්න ප්‍රමාණයක් සමඟ සාකච්ඡා කරන ලදී. එම සාකච්ඡාවන්හිදී සිවිල් සංවිධාන ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කිරීමේදී මුහුණ දෙන ගැටලු හා එම ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් ඔවුන් විසින් කරනු ලැබූ යෝජනා අප වෙත ඉදිරිපත් කරන ලදී. ඔවුන් ඉදිරිපත් කළ ගැටලු හා ඊට ඔවුන් ඉදිරිපත් කළ විසඳුම් සාරාංශයක් පහත වගුවේ සඳහන් වේ.

| | ගැටලු | විසඳුම් යෝජනා |
|---|---|---|
| 01 | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ කටයුතු කරනු ලබන සමහර නිලධාරීන්ගේ රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි ඇති වෛරී ආකල්පයන් වෙනස් කිරීම. | රාජ්‍ය නොවන සංවිධාන විසින් කරනු ලබන සේවාවන් හා ක්‍රියාවන් සම්බන්ධව හා රටට ගෙන එනු ලබන විදේශ විනිමය සම්බන්ධව අධ්‍යයනයකින් පසුව ඔවුන් යම් කිසි ඇගයීමකට භාජනය කිරීම. රාජ්‍ය නොවන සංවිධාන සමග සුහදශීලීව කටයුතු කරන ක්‍රමයක් ස්ථාපිත කිරීම. |
| 02 | සමහර රාජ්‍ය නොවන සංවිධානවලට වෙනස් කොට සැලකීම. | සියලුම රාජ්‍ය නොවන සංවිධාන එක හා සමානව සැලකීම, වෙනස් කොට නොසලකන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීම හා වෙනස්කොට සැලකීම් පිළිබඳව සොයා බැලීම සඳහා ඒකකයක් ස්ථාපිත කිරීම. |
| 03 | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ අරමුණු හා වගකීම් පිළිබඳවත් එහි සීමාවන් හා නෛතික රාමුව පිළිබඳව අවබෝධය ප්‍රමාණවත් නොවීම. | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් හා අවබෝධයෙන් කටයුතු කිරීම මූලික පරමාර්ථයක් කර ගැනීම. ලේකම් කාර්යාලයේ වගකීම් සීමාවන් හා නෛතික තත්ත්වයන් පිළිබඳව රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ඒකාබද්ධව සූදානම් කිරීම. |
| 04 | මෙම ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂකවරයා (ලේඛකාධිකාරී) ඇතුලු සමහර නිලධාරීන්ගේ විවිධාකාර හැසිරීම්, බියගැන්වීම් හා තර්ජනයන් නැවත ඇති නොවන ආකාරයට එම තනතුරේ ගරුත්වය ආරක්ෂා කිරීම හා එහි වගකීම් නිශ්චිත කිරීම. | අධ්‍යක්ෂකවරයාගේ (ලේඛකාධිකාරී) තනතුරේ වගකීම් හා නෛතික සීමාවන් පිළිබඳව පැහැදිලි කර ගැනීම හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ කටයුතු හා රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධය වෘත්තීය මට්ටමින් දියුණු කිරීමට කටයුතු කිරීම. |
| 05 | සමහර දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාරයාල තුළ සිටින රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියාමාර්ග හා අධිපතිවාදී ස්වරූපය. | තම නෛතික සීමාවන් තුළ ඉතා සුහදශීලීව හා සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් වෙත ලබා දීම හා එසේ කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීම. දෙපාර්ශවයේ ගැටලු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවන් සැලසීම. |

| | | |
|---|---|---|
| 06 | ප්‍රාදේශීය ලේකම්/ ග්‍රාම නිලධාරී ඇතුළු නිලධාරීන්ගෙන් ව්‍යාපෘති ක්‍රියාකාරම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ ඇති දුෂ්කරතා හා විටින් විට විවිධාකාරයේ වාර්තා ඉල්ලා සිටීම, එම වාර්තා අධිකාරීන් කිහිපයක් වෙත යොමු කිරීමට සිදු වීම. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රමය පිළිබඳව නැවත සලකා බැලීම. අනුමැතියක් අවශ්‍ය වන්නේ නම් සරල ක්‍රමයක් ස්ථාපිත කිරීම, වාර්තාකරණය සම්බන්ධව සරල ව්‍යුහයක් සැකසීම හා දෙපාර්ශවය එකඟ වන එක් අධිකාරියකට එම වාර්තා යොමු කිරීම. |
| 07 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් (පලාත්පාලන ආයතන) හරහා සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ ඇති ගැටලු. | සියලු ව්‍යාපෘති ක්‍රියාකාරම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව නැවත සලකා බැලීම හා අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාකාරකම් වෙනුවෙන් පමණක් අනුමැතිය ලබා ගැනීමට යොමු කිරීම. |
| 08 | යුද, ගුවන්, නාවික, පොලිස් හා රාජ්‍ය බුද්ධි අංශ විටින් විට විවිධ සංවිධාන වෙත පැමිණීමත්, ඔවුන් විසින් විවිධ වාර්තා හෝ තොරතුරු ඉල්ලා සිටීම. | එසේ තොරතුරු අවශ්‍ය නම්, සිවිල් අධිකාරීන් හරහා එම තොරතුරු ලබා ගැනීමට ක්‍රමයක් සැකසීම. ආරක්ෂක අංශ විසින් සිදු කරනු ලබන බලපෑම්, තර්ජන හෝ බියගැන්වීම් ඇති වන ආකාරයේ ක්‍රියාවන් වැළැක්වීමට කටයුතු කිරීම. යම් සංවිධානයකට එරෙහිව විශේෂ පැමිණිල්ලක් හෝ පරීක්ෂණයක් නොමැති අවස්ථාවකදී ආරක්ෂක අංශ විසින් සිදු කරනු ලබන මැදිහත්වීම් නතර කිරීමට කටයුතු කිරීම. |
| 09 | ආරක්ෂක අංශ සමහර සංවිධාන ක්‍රියාධරයන්ගේ පෞද්ගලික නිවෙස් වෙත පැමිණීම හා තොරතුරු ඉල්ලා සිටිම. (ක්‍රියාධරයන් නිවසේ නොමැති අවස්ථාවල මෙම ආරක්ෂක අංශ පැමිණ ඇති බව වාර්තා වේ) ඒ හේතුවෙන් පවුලේ සාමාජිකයින් බියට පත්වීම. | තොරතුරු ලබා ගැනීමේ මුවාවෙන් සංවිධාන ක්‍රියාධරයන් බිය ගැන්වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. යම් සංවිධානයක තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් නිත්‍යානුකූල ක්‍රමවේදයක් හරහා කාර්යාල වෙත පමණක් පැමිණ එම තොරතුරු ලබා ගැනීම. |
| 10 | වෙනත් දිස්ත්‍රික්කයක් තුළ වැඩ කිරීමේදී ඇතිවෙන දුෂ්කරතා. | අරමුදල් හා හැකියාව ඇති සංවිධාන වෙත එසේ කටයුතු කිරීමට ඇති දුෂ්කරතා ඉවත් කිරීම. |
| 11 | රජයේ සංවර්ධන වැඩසටහන් සමග කටයුතු කරනු ලබන සංවිධාන වෙත ලබා දෙන සහයෝගය අනෙකුත් වැඩසටහන් කරනු ලබන සංවිධාන සඳහා ලේකම් කාර්යාල විසින් ලබා නොදීම. | සංවර්ධනය මෙන්ම, සාමය, පරිසරය, මානව අයිතීන් වෙනුවෙන් කටයුතු කරන සංවිධාන සඳහා ද සමානව සැලකීම. |
| 12 | නව සංවිධාන ලියාපදිංචි කිරීමට යාමේදී මතුව ඇති දුෂ්කරතා. | නව සංවිධාන ලියාපදිංචිය සඳහා ඇති නීති හා ක්‍රමවේදයන් ලිහිල් කර සංවිධාන ලියාපදිංචියට අවස්ථාව විවර කිරීම. |
| 13 | රජය හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වය අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව පළුදු වී තිබීම. | සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා දෙපාර්ශවය මුහුණ දෙන ගැටලු නිරාකරණය සඳහා අමාත්‍යංශය, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය අතර සන්නිවේදනය ක්‍රමයක් ස්ථාපිත කිරීම. |

# 8 ප්‍රාදේශීය සාකච්ඡා

2021 සැප් 16 සිට 2023 මැයි 13 දක්වා මෙම සාකච්ඡා පවත්වන ලදී.

**සූම් ඔස්සේ සිදු කළ රැස්වීම් - 7**

| | දිස්ත්‍රික්කය | දිනය | සහභාගී වූ පිරිස් | සම්පත් දායකයින් |
|---|---|---|---|---|
| 01 | අනුරාධපුර දිස්ත්‍රික්කය | 2021.9.16 | 18 | රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක |
| 02 | සබරගමුව පළාත | 2021.09.18 | 40 | රැකී ප්‍රනාන්දු, නීතිඥ අර්මිසා ටීගල්, තිලක් කාරියවසම්, රෝහණ හෙට්ටිආරච්චි, පිලිප් දිසානායක |
| 03 | ඌව පළාත | 2021.09.25 | 50 | රැකී ප්‍රනාන්දු, නීතිඥ අර්මිසා ටීගල්, රෝහණ හෙට්ටිආරච්චි, පිලිප් දිසානායක |
| 04 | ගාල්ල දිස්ත්‍රික්කය | 2021.09.26 | 57 | රැකී ප්‍රනාන්දු, තිලක් කාරියවසම්, රෝහණ හෙට්ටිආරච්චි, කුමුදුනී සැමුවෙල්, පිලිප් දිසානායක |
| 05 | මාතර දිස්ත්‍රික්කය | | | |
| | හම්බන්තොට දිස්ත්‍රික්කය | 2021.09.30 | 63 | නීතිඥ අර්මිසා ටීගල්, පිලිප් දිසානායක, නීතිඥ නදීෂානි පෙරේරා |
| 06 | කුරුණෑගල දිස්ත්‍රික්කය | 2021.10.07 | 24 | ආචාර්ය ජෙහාන් පෙරේරා, රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක |
| 07 | පුත්තලම දිස්ත්‍රක්කය | 2021.10.18 | 32 | රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, නීතිඥ අර්මිසා ටීගල්, සමන් හමන්ගොඩ |
| | එකතුව | | 284 | |

**ප්‍රාදේශීය රැස්වීම් - 19**

| | පළාත / දිස්ත්‍රික්කය | දිනය | සහභාගී වූ පිරිස් | සම්පත් දායකයින් |
|---|---|---|---|---|
| 01 | ගම්පහ | 2021.10.25 | 34 | තිලක් කාරියවසම්, රෝහණ හෙට්ටිආරච්චි, සමන් හමන්ගොඩ, රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, චමින්ද රාජකරුණා |
| 02 | කළුතර | 2021.11.09 | 35 | තිලක් කාරියවසම්, පිලිප් දිසානායක, අර්මිසා ටීගල්, චමින්ද රාජකරුණා |
| 03 | උතුරු මැද පළාත (හබරණ) | 2022.02.27 | 16 | රැකී ප්‍රනාන්දු, තිලක් කාරියවසම්, ජෙහාන් පෙරේරා, පිලිප් දිසානායක |
| 04 | මධ්‍යම පළාත (නුවර) | 2022.02.28 | 20 | රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, තිලක් කාරියවසම්, |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ගාල්ල | 2022.03.22 | 45 | රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක,<br>ආචාර්ය ජෙහාන් පෙරේරා, නීතිඥ නදීෂානි පෙරේරා |
| 06 | මාතර | 2022.03.22 | 42 | රැකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක,<br>ආචාර්ය ජෙහාන් පෙරේරා, නීතිඥ නදීෂානි පෙරේරා |
| 07 | කුරුණෑගල | 2022.03.29 | 30 | තිලක් කාරියවසම් |
| | | | | |
| 08 | කෑගල්ල | 2022.04.02 | 20 | තිලක් කාරියවසම් |
| | | | | |
| 09 | බදුල්ල | 2022.04.02 | 60 | ගෞතමන් බාලචන්ද්‍රන්, පිලිප් දිසානායක,<br>සුරේෂ් නඩේසන් |
| 10 | හම්බන්තොට | 2022.08.20 | 29 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,<br>තිලක් කාරියවසම් |
| 11 | මොණරාගල | 2022.08.21 | 41 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,<br>තිලක් කාරියවසම් |
| 12 | කළුතර | 2022.08.24 | 26 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,<br>තිලක් කාරියවසම් |
| 13 | හැටන් | 2022.08.27 | 18 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,<br>තිලක් කාරියවසම් |
| 14 | ගම්පහ | 2022.08.23 | 15 | තිලක් කාරියවසම්, පිලිප් දිසානායක,<br>ජෙහාන් පෙරේරා, ජෙහාන් තිගදීසන් |
| 15 | අනුරාධපුර | 2022.11.05 | 31 | ජෙහාන් පෙරේරා, තිලක් කාරියවසම්, රැකී ප්‍රනාන්දු,<br>පිලිප් දිසානායක |
| 16 | කුරුණෑගල | 2022.11.06 | 37 | ජෙහාන් පෙරේරා, තිලක් කාරියවසම්, පිලිප්<br>දිසානායක |
| 17 | මාතර | 2023.02.18 | 39 | ජෙහාන් පෙරේරා, දුලාන් දසනායක, පිලිප්<br>දිසානායක |
| 18 | කන්තලේ | 2023.04.30 | 35 | දුලාන් දසනායක, පිලිප් දිසානායක, ලක්ෂාන්<br>ප්‍රනාන්දු |
| 19 | බදුල්ල | 2023.05.13 | 39 | ලක්ෂාන් ප්‍රනාන්දු, පිලිප් දිසානායක, සුරේෂ්<br>නඩේසන් |
| | එකතුව | | 612 | |

# 9 නිර්දේශ

1 රජය සියලුම රාජ්‍ය නොවන සංවිධාන වෙත සමාන ලෙස සැලකීම හා වෙනස් කොට නොසැලකීම.

2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් අදහස් ප්‍රකාශ කිරීමේ, සමාගමේ හා රැස්වීමේ නිදහස යන මූලික අයිතිවාසිකම් වලට ගරු කරමින් කටයුතු කිරීම.

3 අනවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම් හෝ අතපෙවීම් නතර කොට අදාළ රාජ්‍ය නොවන සංවිධානයේ ස්වාධීනත්වය හා සංවිධානයේ වටිනාකම් ගරුකරමින් නිදහසේ කටයුතු කිරීමට ඉඩ කඩ සලසා දීම.

4 අවශ්‍යතා මත ජාලගතවීමට, සන්නිවේදනයට, අනෙකුත් සංවිධාන හෝ කණ්ඩායම් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමට ඇති අයිතියට ගරු කිරීම.

5 නීත්‍යානුකූලව ලැබෙන අරමුදල් සංවිධානයේ අරමුණු හා සැලසුම් මත වැය කිරීමට අවශ්‍ය නිදහස ලබා දීම.

6 සිවිල් සමාජ සංවිධාන ඉලක්ක කර සකසනු ලබන නීති සඳහා එම සංවිධානයන්හි අදහස් ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසීම.

7 සිවිල් සංවිධාන පාලනය සඳහා නීති සකසන්නේ නම් ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම.

8 සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය සක්‍රියව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පරිසරය රට තුළ නිර්මාණය කිරීම.

9 සිවිල් සංවිධාන විසින් කරනු ලබන සේවා ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

10 සිවිල් සංවිධාන විසින් සකස්කරනු ලබන චර්යාධර්ම පද්ධතියක් තුළ කටයුතු කිරීම සඳහා ඔවුන් දිරි ගැන්වීම.

# ආශ්‍රිත ලේඛන

1 ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන මුහුණ දෙන අභියෝග (සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ජාතික එකමුතුවේ ප්‍රකාශනය)[1]

2 ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව - මලිත් ජයතිලක වාර්තාව[2]

3 NGO භීතිකාව හා තන්දන - විජිත අතුරු වාර්තාව (ප්‍රබෝධ රත්නායක/ ජයනි අබේසේකර විසින් සමබිම පුවත්පතට ලියන ලද ලිපිය[3]

1 https://www.right2lifelanka.org/2022-aug-vsso-reports-in-sinhala-and-tamil/
2 https://www.parliament.lk/uploads/comreports/1582610778064822.pdf
3 https://srihanda.lk/2020/07/20/ngo-phobia/?fbclid=IwAR0mpKV9P12dwsa8w9P34BdVCvjYh6kbydGgvONSbv2te0fpX-oOG6fkYwE

ඇමුණුම් - 1

සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන එකමුතුව විසින් මහජන ආරක්ෂාව පිළිබඳව කැබිනට් අමාත්‍ය ටිරාන් අලස් මහතා වෙත 2023 ජනවාරි 31 වන දින ඉදිරිපත් කළ සිවිල් සමාජ මූලධර්ම ප්‍රකාශනය (Guiding Principles for a Legal and Policy Framework relating to Not-for-Profit organizations)

**Guiding Principles for Policy on Not for Profit Social Service organizations**

This document details the principles that are recommended to inform a policy framework on Sri Lanka's State engagement with not-for-profit social service organizations. It is also the guidelines to be adhered to when drafting any legislation relating to this sector.

**Legal Standards**

Any law should adhere to the fundamental rights guaranteed to the citizens under the Sri Lankan constitution. It should respect the international conventions and standards that Sri Lanka has subscribed to and agreements and commitments Sri Lanka has made.

The constitution of the Democratic Socialist Republic of Sri Lanka of 1978 in article 14 (1) guarantees the freedom of assembly and expression. Article 14 (1)[1] secures the constitutional rights of freedom of association, subject to limitations as stipulated by Article 15 (4)[2].The rights to freedom of association serve as a vehicle for the exercise of many other civil, cultural, economic political and social rights.[3] These rights are essential components of democracy as they empower people to express their political opinions, engage in literary and artistic pursuits and other cultural, economic and social activities, engage in religious observances or other beliefs, form and join trade unions and cooperatives, and elect leaders to represent their interests and hold them accountable.[4]

International Conventions and Standards also apply. Sri Lanka is a party to including the Universal Declaration of Human Rights (UDHR) 1948[5], International Covenant on Civil and Political Rights (ICCPR) 1966[6], International Covenant on Economic, Social, and Cultural Rights (ICESCR)[7], the Convention on the Elimination of Discrimination against Women (CEDAW) and the International Covenant on the Elimination of all Forms of Racial Discrimination[8].

---

1 Article 14 (1) - Every citizen is entitled to; (a) the freedom of speech and expression including publications, (b) the freedom of peaceful assembly, (c) the freedom of association. civil society organizations to operate in ways consistent with commitments to freedom of association, and in the Sustainable Development Goals (SDGs) for an enabling environment for civil society. The Busan Principles relating CSO effectiveness also recognizes the value of ensuring "the participation of the full diversity of CSOs as independent development actors in their own right" and the promotion of "equitable and just development cooperation architecture".

2 Limitations prescribed by law in the interests of racial and religious harmony or national economy.

3 Thus, freedom of association is a valuable indicator of a state's respect for the enjoyment of human rights. The right to freedom of association and assembly is also frequently linked to the freedom of expression and freedom of movement.

4 MainaKiai, Report of the Special Rapporteur on the rights to freedom of peaceful assembly and of association, 20th sess., UN Doc A/HRC/20/27 (21 May 2012).

5 Article 20 (1) - Everyone has the right to freedom of peaceful assembly and association; Article 29 (2) - In the exercise of his rights and freedoms, everyone shall be subject only to such limitations as are determined by law solely for the purpose of securing due recognition and respect for the rights and freedoms of others and of meeting the just requirements of morality, public order and the general welfare in a democratic society.

